# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2025

## Open/Limited Competitive Examination for Recruitment to the Posts of Supervisory Management Assistant –Technical Service Category of Ministry of Education, Higher Education and Vocational Education - 2025

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය තුළ පුරප්පාඩුව පවතින,

ප්‍රවාහන නිලධාරි තනතුරු 01 ක්,
තාක්ෂණ නිලධාරි තනතුරු 03 ක්,
ගොඩනැගිලි පරීක්ෂක තනතුරු 03ක් හා
සැලසුම් ශිල්පී තනතුරු 04ක් සඳහා සහ
අමාත්‍යාංශය යටතේ පවතින ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළ පුරප්පාඩුව පවතින ගොඩනැගිලි පරීක්ෂක තනතුරු 19 ක් හා ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර තනතුරු 20 ක් සඳහා

සීමිත හා විවෘත පදනමින් බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ඔක්තෝබර් මස 07 වැනි දින පෙ.ව 09.00** ට විවෘතවන අතර **2025 නොවැම්බර් මස 04 වැනි දින රාත්‍රී 09.00** ට අවසන් වේ.

විභාගය **2026 ජනවාරි මාසයේ දී කොළඹ දී** පැවැත්වේ.

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**01. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

1.1 මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.)

1.2 වැටුප් පරිමාණය : මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN 03-2025
**රු. 52,250 - 10x800 – 11x1190 – 10x1320 -10x1350 – රු.100,040** ක (මාසික)
වැටුප් පරිමාණයක් හිමි වේ. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් තලය රු. 52,250 /= ක් වේ.

1.3 ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05 ක දී ලබා ගත යුතු ය.

1.4 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**02. බඳවා ගැනීමේ ශ්‍රේණිය - III ශ්‍රේණිය**

**03. බඳවාගැනීමේ ක්‍රමය : මෙම තනතුර සඳහා බඳවාගැනීම් විවෘත හා සීමිත ධාරාවන් යටතේ සිදුකරනු ලැබේ.**

3.1 බඳවාගැනීමේ ප්‍රතිශත:

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |

3.2 පුරප්පාඩු පවතින සේවා ස්ථාන

3.2.1 අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය :

| ස්ථානය | ප්‍රවාහන නිලධාරි | තාක්ෂණ නිලධාරි | | ගොඩනැගිලි පරීක්ෂක | | සැලසුම් ශිල්පී | |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය (ඉසුරුපාය පරිශ්‍රය) | විවෘත | විවෘත | සීමිත | විවෘත | සීමිත | විවෘත | සීමිත |
| | 01 | 02 | 01 | 02 | 01 | 03 | 01 |

3.2.2 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ :

| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | ගොඩනැගිලි පරීක්ෂක | ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර |
|---|---|---|---|
| 1 | මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 2 | සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 3 | සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, නිට්ටඹුව | 1 | 1 |
| 4 | දඹදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය , දඹදෙණිය | 1 | 1 |
| 5 | හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 6 | පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 7 | දර්ගා නගර් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 8 | රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 9 | නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 10 | රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 11 | ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 12 | මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 13 | පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | 1 |
| 14 | පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 15 | වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | - |
| 16 | තාක්ෂණවේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, කුලියාපිටිය | - | 1 |
| 17 | ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 18 | මඩකලපුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 19 | අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 20 | වවුනියා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| 21 | යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 1 | 1 |
| | එකතුව | 19 | 20 |

3.3 විවෘත හෝ සීමිත ධාරා යටතේ උපරිමය තනතුරු 03 ක් දක්වා ඉල්ලුම් කළ හැක.

3.4 ගොඩනැගිලි පරීක්ෂක සහ ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර යන තනතුරු සඳහා ඉල්ලුම්කරන අයදුම්කරුවන් වෙත සේවා ස්ථානය, ඉල්ලුම්කරනු ලබන ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව ලබාදෙනු ලබන අතර එක් අයදුම්කරුවකුට සේවා ස්ථාන 03 ක් සඳහා ප්‍රමුඛතාව අනුව ඉල්ලුම් කළ හැකිය.

3.5 සේවා ස්ථාන සඳහා ස්ථානගත කිරීමේ දී සීමිත හෝ විවෘත තරග විභාගයෙන් ඉහළ ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙළට අයදුම්කරුවන්ගේ ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාව ලබාදෙනු ලැබේ.

3.6 සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින්ම තෝරාගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන් ම සම්පූර්ණ කරගැනීමට කටයුතු කරනු ලැබේ.

**04.** **විවෘත බඳවාගැනීම :**

4.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව මෙම තනතුරට පත්වීම් ලබන නිලධරයකු වසර 03 ක පරිවාස කාලයකට යටත්වන අතර එම කාලය ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4.2 රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් මෙම තනතුරට පත්වීම් ලබන නිලධරයන්ට පමණක් වසර 03ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව වසර 05 ක් ඇතුළත ලබාගත යුතුය.

4.3 බඳවා ගැනීමේ සුදුසුකම් :

4.3.1 අධ්‍යාපන සුදුසුකම්:

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් 2 ක් සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම ;

*සහ*

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය හා තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

4.3.2.වෘත්තීය සුදුසුකම් :

***(අ) ගොඩනැගිලි පරීක්ෂක , තාක්ෂණික නිලධාරි සහ ප්‍රවාහන නිලධාරි තනතුරු සඳහා :***

මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව ;

*හෝ*

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ;

*හෝ*

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ;

*හෝ*

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

***(ආ) සැලසුම් ශිල්පී තනතුර සඳහා :***

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

හෝ

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*(ඇ) ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර සඳහා :*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

*හෝ*

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

4.3.3 පළපුරුද්ද: අදාළ නොවේ.

4.3.4 වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා 2025 ඔක්තෝබර් මස 06 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**05. සීමිත බඳවා ගැනීම :**

5.1 අධ්‍යාපන අමාත්‍යාංශය තුළ දෙපාර්තමේන්තුගත පත්වීම් දරනු ලබන පහත සුදුසුකම් සපුරනු ලබන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

5.1.1 බඳවා ගැනීමේ සුදුසුකම් :

5.1.1.1 අධ්‍යාපන සුදුසුකම්:

(අ) සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් සමත්වීම.

5.1.1.2 වෘත්තීය සුදුසුකම් :

*(අ) ගොඩනැගිලි පරීක්ෂක, තාක්ෂණික නිලධාරි තනතුරු සඳහා*

මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව ;

*හෝ*

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ;

*හෝ*

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ;

*හෝ*

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ;

*හෝ*

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*(ආ) සැලසුම් ශිල්පී තනතුර සඳහා:*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

*හෝ*

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*(ඇ) ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර තනතුර සඳහා :*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;

*හෝ*

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.1.2 ***පළපුරුද්ද*** : ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

5.1.3 **වයස් සීමාව**: අදාළ නොවේ.

5.2 වෙනත් සුදුසුකම් :

(i) පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හා අනුශාංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුයි.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහාවන ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබේනම් පමණි.

**06. කායික සුදුසුකම්:**

6.1 ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

6.2 මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් සමඟ අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

**07. වෙනත් සුදුසුකම් :**

7.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

7.2 අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

7.3 යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

7.4 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**08.** ***බඳවා ගැනීමේ ක්‍රමය*** **:** ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගෙන් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළට අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු බඳවා ගනු ලැබේ.

8.1 *ලිඛිත පරීක්ෂණය* : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් මගින් ලකුණු ලබා දේ.

8.2 ලිඛිත පරීක්ෂණය සම්බන්ධ විස්තර :

| | *විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

8.3 විභාගය සඳහා ප්‍රධාන විෂය නිර්දේශය :

| | *විෂය ක්ෂේත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | • අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාලය කළමනාකරණය, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.<br>• බඳවා ගැනීමේ දී සලකා බලනු ලබන අධ්‍යාපන සුදුසුකම් අනුව සීමිත විභාගය සඳහා සහ විවෘත විභාගය සඳහා වෙන් වෙන් වශයෙන් වූ බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර දෙකක් සැකසේ. |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | • තනතුරට අදාළ තාක්ෂණික දැනුම මැන බැලෙන ප්‍රශ්නවලින් සමන්විත කොටස් දෙකකින් යුත් ප්‍රශ්න පත්‍රයකි.<br>• පහත සඳහන් තනතුරු සඳහා පැවරී ඇති කාර්යයන්වලට අදාළව විෂයානුබද්ධ තාක්ෂණික දැනීම පරීක්ෂා කෙරේ. |

8.4 තනතුරට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණ විෂය නිර්දේශය :

| *තනතුර* | *විෂය නිර්දේශය* |
|---|---|
| තාක්ෂණ නිලධාරි | 1. වැඩබිම් අධීක්ෂණය, වාර්තා කෙටුම්පත් කිරීම සහ නියාමනය<br>2. ඇස්තමේන්තුකරණය සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර දත්ත ලබාගැනීම<br>3. ක්ෂේත්‍ර දත්ත මත ඇස්තමේන්තු සැකසීම හා මිල ගණන් විශ්ලේෂණය<br>4.ප්‍රසම්පාදන කටයුතු<br>5. ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් සහ ඊට අදාළ තාක්ෂණික වාර්තා සැකසීම<br>ඉහත කාර්යයන්වලට අදාළ NVQ 6 මට්ටමේ දැනුම හා කාර්යයන්ට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික දැනුම පරීක්ෂා කෙරේ. |
| සැලසුම් ශිල්පී | 1. ඉංජිනේරු, වාස්තු විද්‍යාඥ සහ තාක්ෂණ නිලධාරින්ගේ අවශ්‍යතා/නිර්මාණ අනුව සැලසුම් සකස් කිරීම<br>2. ඇස්තමේන්තුවල හා ගෙවීම් බිල්පත්වල ගණිතානුකූල නිරවද්‍යභාවය පරීක්ෂා කිරීම<br>3. ඉදිකිරීම් ප්‍රගතිය කළමනාකරණය සඳහා සහාය වීම.<br>ඉහත කාර්යයන්ට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික දැනුම පරීක්ෂා කෙරේ. |
| ගොඩනැගිලි පරීක්ෂක | 1. ක්ෂේත්‍ර පරීක්ෂා සිදුකිරීම හා නිරීක්ෂණ/නිර්දේශ වාර්තා කිරීම සහ ක්ෂේත්‍ර මිනුම් කටයුතු හා වැඩබිම් අධීක්ෂණය<br>2. ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව සිදුකිරීමට අවශ්‍ය පරිපූරක සේවා ලබාදීම<br>3. ඉදිකිරීම්වලට අදාළ ගෙවීම් සඳහා බිල්පත් පරීක්ෂාව හා නිර්දේශ කිරීම<br>4. ලංසු ලියවිලි කෙටුම්පත් කිරීම<br>5. තාක්ෂණ ඇගයුම් කමිටුවල සහ මිල ඇගයුම් කමිටුවල කාර්යයන් ඉටුකිරීම<br>6. කනිෂ්ඨ නිලධාරින් නියාමනය හා මෙහෙයවීම<br>7. පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂාව හා නිර්දේශය<br>ඉහත කාර්යයන්වලට අදාළ NVQ 6 මට්ටමේ දැනුම හා කාර්යයන්ට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික දැනුම පරීක්ෂා කෙරේ. |

| තනතුර | විෂය නිර්දේශය |
|---|---|
| ප්‍රවාහන නිලධාරි | 1. අමාත්‍යාංශය යටතට ගැනෙන සියලු වාහන අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, පාවිච්චියට නුසුදුසු වාහන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම<br>2. වාහන අලුත්වැඩියාවට ඉදිරිපත් කිරීමේ දී වාහනයේ ඇති දෝෂ පිළිබඳ පැහැදිළිව නිගමනය කිරීම<br>3. වාහන අලුත්වැඩියාව සම්බන්ධව ගරාජය විසින් ඉදිරිපත් කරන ඇස්තමේන්තු පරීක්ෂා කර බලා අදාළ අලුත්වැඩියාව, අමතර කොටස් යෙදීම හා ඇස්තමේන්තුවේ සඳහන් මිල ගණන් සාධාරණ ද යුක්ති සහගත ද යන බව සෑහීමකට පත්ව එම ඇස්තමේන්තු නිර්දේශ කිරීම<br>4. වාහන අලුත්වැඩියාවෙන් පසු එම අලුත්වැඩියාව නිසි පරිදි ඉටුකර තිබේ ද යන්න වාහනය පරීක්ෂා කර බලා බිල්පත් ගෙවීමට ප්‍රථම නිර්දේශ කිරීම<br>5. රියදුරන් විසින් වාහනය මනාව නඩත්තු කරන්නේ ද යන වග මාසිකව පරීක්ෂා කර බැලීම හා ඒ සම්බන්ධව අදාළ නිර්දේශයන් උසස් නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම<br>6. වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම<br>7. වාහන අනතුරකට පත්වූ විට ඒ ගැන පරීක්ෂණ පැවැත්වීම, අලාභය පිළිබඳ වගකීම ගණන් බැලීම<br>8. වාහන සේවා කිරීම සඳහා නියමිත කාලය තුළ ඉදිරිපත් කිරීම<br>9. වාහන අලුත්වැඩියාවේ අමතර කොටස් යොදා පැරණි කොටස් නිසි පරිදි භාරගෙන ලේඛන ගතකොට ගබඩාව වෙත යැවීම<br>10. වාහන ධාවනයේදී ඇති වන අනතුරු ආදියේ දී පවරන නඩුහබ ආදිය සම්බන්ධයෙන්වන සියලු කටයුතු හා ඒ පිළිබඳ ලිපිගොනු පවත්වාගෙන යාම<br>11. වාහන රක්ෂණය කිරීම හා අනතුරුවල දී අලාභ ඇතිවූ විට අලාභය නියමිත වශයෙන් අයකර ගැනීමට කටයුතු කිරීම<br>ඉහත කාර්යයන්වලට අදාළ NVQ 6 මට්ටමේ දැනුම හා ඉහත කාර්යයන්ට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික දැනුම පරීක්ෂා කෙරේ. |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර | 1. ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ක්‍රියාත්මක කිරීම හා එම උපකරණවල ක්‍රියාකාරීත්වය පිළිබඳ වගකීම<br>2. සංවිධානාත්මක ලෙස ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයක් පවත්වාගෙන යාම හා සියලුම ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ භාරව සිටීම<br>3. රාජකාරියට අදාළ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ලබාගැනීමට කටයුතු කිරීම හා ඒකකයට අදාළව ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සඳහා උප ඉන්වෙන්ට්‍රියක් පවත්වාගෙන යාම<br>4. උපකරණ, අභ්‍යන්තර හා බාහිර ඉගැන්වීම් අවශ්‍යතා සඳහා හැකි සෑම අවස්ථාවක්ම විධිමත්ව ලබාදීම<br>ඉහත කාර්යයන්වලට අදාළ NVQ 6 මට්ටමේ දැනුම හා ඉහත කාර්යයන්ට අදාළ විෂයානුබද්ධ තාක්ෂණික දැනුම පරීක්ෂා කෙරේ. |

09. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

**10. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරන අතර ලකුණු ලබා දෙනු නොලැබේ.

**11.** විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර දෙකට ම පෙනී සිටිය යුතුය.

**12.** මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**13. විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු.600/=කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින්
(Any Bank Credit Card)
(ii) ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින්
(Any Bank Debit Cards)
(iii) ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින්
(Bank of Ceylon Online Banking Method)
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින්
(Bank of Ceylon Teller Slip Payment)

*සැලකිය යුතුය* : ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

**14.** විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනයන් පමණක් වලංගුය.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි හා විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳ නොසිටින බව තහවුරු කර ගැනීම සඳහා මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

15. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා මාර්ගගතව අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ

ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත, සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී /සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

16. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

17. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

18. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනය මගින් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

19. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

නාලක කලුවැව,<br>
ලේකම්,<br>
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ<br>
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 සැප්තැම්බර් මස 09 .වැනි දින,<br>
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

10 - 08

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේවන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරි (විනය) තනතුරේ පවතින පුරප්පාඩු **10** ක් විවෘත පදනමින් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ඔක්තෝබර් මස 07 වැනි දින පෙ.ව. 9.00**ට විවෘත වන අතර **2025 නොවැම්බර් මස 06 වැනි දින රාත්‍රී 9.00**ට අවසන් වේ. **2026 ජනවාරි මස කොළඹ** දී විභාගය පැවැත්වීම සඳහා කටයුතු කරනු ලැබේ.

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. යොමු කරන ලද අයදුම්පත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වාම ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

i) අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක

# Examinations, Results of Examinations & c.

## MINISTRY OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ
අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ තනතුරු සඳහා
බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2025

**Open / Limited Competitive Examination for Recruitment to the Posts of Supervisory Management Assistant – Technical Service Category of Ministry of Education, Higher Education and Vocational Education - 2025**

THE applications are invited from Sri Lankan citizens who meet the following qualifications for the recruitment on limited and open basis to fill 01 post of Transport Officer, 03 posts of Technical Officer, 03 posts of Building Inspector, and 04 posts of Draughtsman vacant in the Ministry of Education, Higher Education and Vocational Education, and for 09 posts of Building Inspector and 20 posts of Audio Visual Assistant vacant in the National College of Education under the Ministry. The application form thereof is available in "Online Applications – Recruitment Exams/ E.B. Exams" under "Our Services" on the website www.doenets.lk of the Department of Examinations, Sri Lanka, and the applications can be submitted online through the online method. The acceptance of the online applications will be open at **09.00 a.m. on 07th October 2025 and ended at 09.00 p.m. on 04th November 2025.** The examination will be held in Colombo in January 2026.

The officers currently serving in the public /provincial public service should submit a copy of the application to the Heads of Institutions for the inclusion in their personal files, and should submit a copy of the application certified by the Head of Institution and a letter to substantiate the service when called for interview.

The applicant is required to bear any adverse consequences that may occur due to delaying the submission of applications until the closing date.

01. **Conditions of Employment:**

1.1 This post is permanent and pensionable. (You shall be subject to future policy decisions taken by the Government regarding a pension scheme)

1.2 *Salary Scale:* As per the Public Administration Circular 10/2025, the salary scale of MN 03-2025 Rs. 52250 - 10x800 – 11x1190 – 10x1320 -10x1350 – Rs.100,040 (monthly) is applicable to this post. The starting salary scale applicable to the grade system is Rs. 52,250 /=.

1.3 According to the Sri Lanka Technological Service Minute, Public Administration Circular No.18/2020 and the circulars incidental thereto, the language proficiency level should be achieved within 05 years.

1.4 This appointment shall be subject to the Procedural Rules of the Public Service Commission, the Establishments Code of the Democratic Socialist Republic of Sri Lanka and the Government Financial Regulations and other departmental orders.

02. *Grade of Recruitment* - Grade III

03. *Recruitment Method* : The recruitment for this position will be done under open and limited streams.

3.1 Recruitment percentage:

| *Stream* | *Percentage* |
|---|---|
| Open | 70 % |
| Limited | 30% |

3.2 Place of Works with vacancies

3.2.1 Ministry of Education, Higher Education and Vocational Education

| *Location* | *Transport Officer* | *Technical Officer* | | *Building Inspector* | | *Draftsman* | |
|---|---|---|---|---|---|---|---|
| Ministry of Education, Higher Education and Vocational Education (Isurupaya Premises) | Open | Open | Limited | Open | Limited | Open | Limited |
| | 01 | 02 | 01 | 02 | 01 | 03 | 01 |

3.2.2 National Collages of Education :

| | *National College of Education* | *Building Inspector* | *Audio Visual Assistant* |
|---|---|---|---|
| 1 | Maharagama National College of Education | 1 | 1 |
| 2 | Siyane National College of Education | 1 | 1 |
| 3 | Sariputta National College of Education, Nittambuwa | 1 | 1 |
| 4 | Dambadeniya National College of Education, Dambadeniya | 1 | 1 |
| 5 | Hapitigama National College of Education | 1 | 1 |
| 6 | Pasdunrata National College of Education | 1 | 1 |
| 7 | Darga Town National College of Education | 1 | 1 |
| 8 | Ruhuna National College of Education | 1 | 1 |
| 9 | Nilwala National College of Education | 1 | 1 |
| 10 | Ruwanpura National College of Education | 1 | 1 |
| 11 | Sri Pada National College of Education | 1 | 1 |
| 12 | Mahaweli National College of Education | 1 | 1 |
| 13 | Peradeniya National College of Education | - | 1 |
| 14 | Pulathisipura National College of Education | 1 | 1 |
| 15 | Wayamba National College of Education | 1 | - |
| 16 | National College of Education on Technology | - | 1 |
| 17 | Uva National College of Education | 1 | 1 |
| 18 | Batticaloa National College of Education | 1 | 1 |
| 19 | Addalaichenai National College of Education | 1 | 1 |
| 20 | Vavuniya National College of Education | 1 | 1 |
| 21 | Jaffna National College of Education | 1 | 1 |
| | Total | 19 | 20 |

3.3 The applications can be sent for a maximum of 03 posts under open or limited streams.

3.4 The place of work for the applicants applying for the posts of Building Inspector and Audio Visual Assistant will be allocated in the priority order requested and each applicant can apply for up to 03 posts on a priority basis.

3.5 In the process of making placements for work places, the priority will be given to the requests of applicants in the order of the higher marks obtained in the limited or open competitive examination.

3.6 Only in case of the lack of enough internal applicants with basic qualifications within the Ministry for the percentage to be recruited through the limited competitive examination, the remaining number will be filled from external applicants selected through the open competitive examination.

04. **Open Recruitment**

4.1 As per the Sri Lanka Technological Service Minute, an officer appointed to this post is subject to a 03-year probation period and should pass the first efficiency bar examination within the said period.

4.2 Only the officers appointed to this post through a medium of language other than an official language should acquire the proficiency in one official language within 05 years, and proficiency in the other official language should be acquired within 05 years.

4.3 **Recruitment Qualifications:**

4.3.1 Educational Qualifications:

(a) Passed in three (03) subjects belonging to the Science/ Mathematics/ Technology stream at the General Certificate of Education (Advanced Level Examination) in one sitting, including 2 subjects from the subjects of Combined Mathematics, Physics, Engineering Technology, and Science for Technology.

*and*

(b) Passed in six (06) subjects at the General Certificate of Education (Ordinary Level) Examination in one sitting, including Sinhala/ Tamil/ English Language, Science, Mathematics and one other subject, with a credit pass.

4.3.2 **Professional Qualifications:**

*(a)* ***For the posts of Transport Officer, Building Inspector, and Technical Officer***

National Diploma in Technology awarded by the University of Moratuwa or Hardy Institute, Ampara;

Or

National Diploma in Engineering Science awarded by the National Apprenticeship and Technical Training Authority ;

Or

Advanced National Diploma in Engineering awarded by the Ministry of Education and Higher Education;

Or

Diploma in Technology awarded by the Open University of Sri Lanka;

Or

Successful completion of the Part 1 of the Engineering Examination conducted by the Institute of Engineers, Sri Lanka

Or

Have completed National Vocational Qualification (NVQ ) Level 06
related to the field of employment

Or

Have obtained other technical qualifications recognized by the Tertiary and Vocational Education Commission as equivalent in all respects to the technical qualifications mentioned above.

(b) ***For the post of Draftsman:***

Successfully completed the one-year full-time course in Draftsmanship from a technical college recognized by the Tertiary and Vocational Education Commission and obtained the relevant certificate.

Or

Having other technical qualifications recognized by the Tertiary and Vocational Education Commission as equivalent in all respects to the aforesaid technical qualifications.

(c) **For Audio Visual Assistant:**

Successful completion of a one-year full-time course in Audio-Visual Technology from a technical college recognized by the Tertiary and Vocational Education Commission and obtaining the relevant certificate.

Or

Have completed the National Vocational Qualification (NVQ) Level 06 related to the field of employment

Or

Possession of other technical qualifications recognized by the Tertiary and Vocational Education Commission as equivalent in all respects to the aforesaid technical qualifications.

4.3.3 Experience: Not applicable

4.3.4 Age Limit : The applicants should be not less than 18 years of age and not more than 30 years of age as on the closing date of applications; 06 October 2025.

05. **Limited Recruitment**

5.1 The applications are invited from the candidates meeting the following qualifications and holding the departmental appointments within the Ministry of Education.

5.1.1 Recruitment Qualifications:

5.1.1.1 Educational Qualifications :

(a) Passing the G.C.E. (O.L) examination in six subjects; not in more than two sittings, with credit passes for the subjects Sinhala/ Tamil/ English Language, Science, and Mathematics.

5.1.1.2 Professional Qualifications:

(a) **For the posts of Building Inspector and Technical Officer**

National Diploma in Technology awarded by the University of Moratuwa or Hardy Institute, Ampara;

Or

National Diploma in Engineering Science awarded by the National Apprenticeship and Technical Training Authority ;

Or

Advanced National Diploma in Engineering awarded by the Ministry of Education and Higher Education;

Or

Diploma in Technology awarded by the Open University of Sri Lanka;

Or

Successful completion of the Part 1 of the Engineering Examination conducted by the Institute of Engineers, Sri Lanka;

Or

Have completed National Vocational Qualification (NVQ ) Level 06 related to the field of employment;

Or

Have obtained other technical qualifications recognized by the Tertiary and Vocational Education Commission as equivalent in all respects to the technical qualifications mentioned above.

(b) **For the post of Draftsman:**

Successful completion of a one-year full-time course in Draftsmanship and obtaining the relevant certificate from a Technical College recognized by the Tertiary and Vocational Education Commission and;

Or

Having other technical qualifications recognized by the Tertiary and Vocational Education Commission as equivalent in all respects to the above technical qualifications.

(c) **For the post of Audio Visual Assistant :**

Successful completion of a one-year full-time course in Audio-Visual Technology and obtaining the relevant certificate from a Technical College recognized by the Tertiary and Vocational Education Commission;

Or

Have completed National Vocational Qualification (NVQ) Level 06 relevant to the field of employment

Or

Having other technical qualifications recognized by the Tertiary and Vocational Education Commission as equivalent in all respects to the above technical qualifications.

5.1.2 **Experience:** Having at least 05 years of active and satisfactory work experience in a relevant field in a permanent and departmental post in a primary or higher service category.

5.1.3 **Age limit :** Not applicable.

5.2 **Other Qualifications** ***:***

(i.) The appointment should have been confirmed.
(ii.) The applicant should have not been subjected to any disciplinary action in accordance with the provisions of Public Service Commission Circular 01/2020 and the Circulars incidental thereto.

(iii.) The officer will be considered to have fulfilled the qualifications required to appear for a written test for recruitment to the post only if he/she has fulfilled all the qualifications in all respects as of the date specified in the notice of calling for applications.

06. **Physical Qualifications:**

6.1 The applicant should be physically and mentally fit to serve in any part of Sri Lanka and to perform the duties of the post.

6.2 If the applicants with special needs sit for this examination, that matter should be compulsorily stated in the application and a printed copy of the application should be submitted along with copies of the relevant medical certificates.

07. **Other Qualifications:**

7.1 The applicant should be a citizen of Sri Lanka

7.2 The applicant should be of a moral character

7.3 Any person who holds priesthood of any religious sect is not eligible to sit this examination.

7.4 All qualifications required for the recruitment to the post should have been fulfilled in every respect as of the closing date of applications.

08. **Recruitment Method:** The applicants who pass the written test will be called for a general interview in merit order of total marks and the recruitments will be done subsequent to the verification of their basic qualifications.

8.1 Written Test: The marks are awarded through a written test conducted by the Department of Examinations, Sri Lanka.

**8.2 The particulars of the written Test:**

| | *Subject Area* | *Duration* | *Total Marks* | *Pass Mark* |
|---|---|---|---|---|
| 01 | Intelligence Test | 01 hour | 100 | 40 |
| 02 | Subject-specific Technical Test | 02 hours | 100 | 40 |

8.3 Main syllabus for the Examination:

| | *Subject Area* | *Syllabus* |
|---|---|---|
| 01 | Intelligence Test | • This consists of the questions that test the logical thinking, analytical skills, and time management of the applicant.<br>• Two separate intelligence test papers are prepared for the limited examination and the open examination, according to the educational qualifications taken into consideration during recruitment. |
| 02 | Subject-specific Technical Test | • A question paper with two parts containing questions that measure the technical knowledge relevant to the post.<br>• Subject-specific technical knowledge is tested in relation to the tasks assigned to the following posts. |

**8.4 The syllabus of Subject-specific Technical Test relevant to the post:**

| *Post* | *Syllabus* |
|---|---|
| Technical Officer | 1. Work site supervision, report drafting and regulation.<br>2. Collecting field data required for estimation.<br>3. Estimate Preparation and Price Analysis based on field data.<br>4. Procurement Activities.<br>5. Field inspections and preparation of related technical reports.<br><br>NVQ Level 6 knowledge relevant to the aforesaid tasks and the subject-specific technical knowledge related to the tasks will be tested. |
| Draftsman | 1. Preparing plans in line with the requirements/designs of engineers, architects and technical officers.<br>2. Checking the numerical accuracy of the estimates and payment bills.<br>3. Assisting for construction progress management.<br><br>Subject-specific technical knowledge related to the above tasks will be tested. |
| Building Inspector | 1. Carrying out field inspections and reporting observations/recommendations and field surveying and site supervision activities.<br>2. Providing supplementary services required for the smooth execution of the procurement process in line with procurement guidelines.<br>3. Checking bills and giving recommendations for construction-related payments.<br>4. Drafting of Bidding Documents.<br>5. Performing the functions of the Technical Evaluation Committees and Price Evaluation Committees.<br>6. Supervising and directing Junior Officers.<br>7. Reviewing the cost estimate and recommendation.<br>NVQ Level 6 knowledge relevant to the above tasks and the subject-specific technical knowledge related to the tasks will be tested. |
| Transport Officer | 1. Repairing and maintaining all vehicles taken under the Ministry, and making recommendations on vehicles not suitable for use.<br>2. Making clear conclusion on the defects in the vehicles at the time of submitting those for repairs.<br>3. Reviewing the estimates submitted by the Garage in respect of vehicle repairs and making recommendations subsequent to being satisfied that the repairs, spare parts and prices stated in the estimate are reasonable and justifiable.<br>4. Inspect the vehicle; after vehicle repairs, to ensure that the repairs have been properly done and make recommendation before paying the bills.<br>5. Carrying out monthly inspections to ensure whether the vehicles are properly maintained by the drivers and presenting the relevant recommendations on that matter to the higher officials.<br>6. Checking fuel combustion of the vehicles.<br>7. Carrying out investigations into vehicle accidents and assessing liability of damages.<br>8. Ensuring that the vehicles undergo servicing on time.<br>9. Applying spare parts for vehicle repairs, properly accepting the old parts and recording those in the respective registers and sending those to the warehouse.<br>10. Dealing with all matters related to the lawsuits filed in connection with accidents happened while driving, and maintaining files on such matters.<br>11. Insuring vehicles and taking steps to recover losses duly in the event of accidents.<br><br>NVQ Level 6 knowledge related to the above tasks and subject-specific technical knowledge related to the above tasks will be tested. |

| *Post* | *Syllabus* |
|---|---|
| Audio Visual Assistant | 1. Responsibility of operating the audio-visual equipment and their functioning.<br>2. Maintaining an audio-visual unit in an organized manner and being in charge of all audio-visual equipment.<br>3. Taking steps to obtain audio-visual equipment related to the duty. Maintaining a sub-inventory for audio-visual equipment related to the unit.<br>4. Providing equipment in a systematic manner at every possible instance for internal and external teaching needs.<br><br>NVQ Level 6 knowledge and the subject-specific technical knowledge related to the above tasks will be tested. |

09. **Aptitude Testing Interview:** Not applicable.

10. **General Interview:**

Only the qualifications of the applicants will be examined by an interview board appointed by the Secretary to the Ministry of Education, Higher Education and Vocational Education and the marks will not be awarded.

11. The examination will be conducted in Sinhala, Tamil and English mediums only in Colombo. The applicants can appear for the examination in one language of their choice. The applicant is required to answer all the question papers of this examination in one language. An applicant will not be allowed to change the medium of examination indicated in his/her application. Every applicant should appear for both the question papers.

12. The online application form for the examination should be completed in **English** only. The applicant will be notified by the Department of Examinations, Sri Lanka that the soft copy submitted online is accepted/not accepted as a valid application by sending a short message (SMS) to the mobile phone number used to access the system or by sending an e-mail to the e-mail address. Please download the general instruction sheet (Common Instructions) prepared in respect of applying for the examination prior to the completion of the online application form. Please strictly follow these instructions when filling the application form. The incomplete applications will be rejected without notice.

13. **Exams Fees:**

The examination fee is Rs. 600/=. The payment should be made only under the following payment methods given in the online system.

(i) Any Bank Credit Card ;
(ii) Any Bank Debit Cards ;
(iii) Bank of Ceylon Online Banking Method ;
(iv) Bank of Ceylon Teller Slip Payment.

**Note**: The instructions about the way of making payments using the above methods are posted on the website under the technical instructions related to the examination.

The receipt of the payment will be acknowledged by a Short Message (SMS) or via an Email. The examination fee should be paid in full, and the applications for which the examination fee has been underpaid or overpaid will be rejected. The Department of Examinations, Sri Lanka is not responsible for any errors occurred in the payment of examination fees through the above payment methods. The amount paid for the examination will not be refunded or transferred to another examination for any reason.

14. The applicants should prove their identity in the examination hall to the satisfaction of the Supervisor of the Examination Hall for each subject they sit for. Only the following documents are valid for this purpose.

I. National Identity Card,
II. Valid passport,
III. Valid Sri Lankan Driving License.

Further, the applicants should enter the examination hall without covering their face and both ears enabling to verify their identity as well as to ensure that they are not wearing electronic communication devices. The applicants who refuse to verify their identity will not be admitted to the examination hall. Further, the applicants should remain without covering their faces and both ears from the moment they enter the examination hall until they leave the hall after ending the examination.

15. The Commissioner General of Examinations will issue admissions of the examination only through online method to the applicants who are in the age limit mentioned in the notification and those who have submitted correctly the completed applications online along with the receipt making payment of prescribed examination fee on or before the closing date of applications assuming that only those who possess the qualifications mentioned in the *Gazette* Notification have applied. Immediately after the admissions of the examination are issued, the Department of Examinations, Sri Lanka will notify the applicants on that issuance through a web notification /SMS. If an applicant has not received the admission, he/she should inquire about the matter from the Institutional Examinations Organization Branch, Department of Examinations, Sri Lanka as mentioned in the advertisement. In making such inquiries, the applicant should accurately mention the title of the examination applied, full name of the applicant, National Identity Card Number and the address. If the applicant resides outside of Colombo, it will be effective to fax a letter of request to the fax number mentioned in the notice along with the aforesaid details including a fax number through which the applicant can obtain a copy of the admission immediately. When making such inquiry, it would be useful to keep a printed copy of the completed application ready to confirm any detail asked by the Department of Examinations. If any amendment to the admission is required subsequent to the perusal made thereto, Department of Examinations, Sri Lanka should be contacted in advance and the relevant amendments should be made as per the application. The requests for amendments made at the examination hall/ interview will not be considered.

16. The issuance of an admission to an applicant for the examination will not be considered as an acceptance that he or she has fulfilled the qualification to sit the examination or to hold a post.

17. The applicant sitting the Examination should produce his/her signature attested admission to the Supervisor of the Examination Hall on the first day he /she faces the examination.

18. The right to take decision on matters related to the notice of calling applications or any other matter not covered by the said notice is vested in the Secretary to the Ministry of Education, Higher Education and Vocational Education authorized by the Public Service Commission.

19. In case of any inconsistency among the Sinhala, Tamil and English languages texts of this notification, the Sinhala text shall prevail.

Nalaka Kaluwewa,
Secretary.

Ministry of Education,
Higher Education and Vocational Education,
This 09th day of September, 2025.

10-18